<u>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් පාසල් ශිෂ්‍යයන්ගේ මාධ්‍ය සාක්ෂරතාව ඉහළ</u>

<u>නැංවීම සඳහා සංවිධානය කරනු ලබන</u>

<u>ඇසිදිසි විදුමඟ පාසල් නිර්මාණ තරගාවලිය - 2026</u>

පාසල් ශිෂ්‍ය ප්‍රජාවේ මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍යය සම්බන්ධ නිර්මාණකරණය ඉහළ නැංවීමේ අරමුණින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ව සංවිධානය කරනු ලබන '**ඇසිදිසි විදුමඟ පාසල් නිර්මාණ තරගාවලිය**' සඳහා නිර්මාණ කැඳවීම 2026 අගෝස්තු මස 05 දින සිට ආරම්භ කෙරේ.

මෙම තරගාවලිය වඩාත් පුළුල් කරමින් 2026 වර්ෂයේදී තරග 10ක් පැවැත්වීමට සැලසුම් කර ඇති අතර එම තරග කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ හා විවෘත යන වයස් කාණ්ඩවලින් පැවැත්වේ. (ඒ අනුව 'හොඳම පර්යේෂණ පත්‍රිකාව' තරගය හැර අනෙකුත් තරග අදාළ වයස් කාණ්ඩ එකකින් හෝ කිහිපයකින් හෝ තරග පැවැත්වේ.) 'හොඳම පර්යේෂණ පත්‍රිකාව' තරගය පාසල් ගුරුවරු සඳහා පමණක් පැවැත්වේ.

කනිෂ්ඨ : 06 ශ්‍රේණියේ සිට 09 ශ්‍රේණිය දක්වා
ජ්‍යෙෂ්ඨ : 10 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා
විවෘත : 06 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා (ඇතැම් තරග විවෘත කාණ්ඩයෙන් පමණක් පැවැත්වේ.)

මෙම තරග සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. (ඇතැම් තරග සිංහල, දෙමළ හා ඉංග්‍රීසී මාධ්‍යවලින් ද, ඇතැම් තරග භාෂා මාධ්‍යය නොසලකා විවෘත මාධ්‍යයෙන් ද පැවැත්වේ.)

පාසල් ශිෂ්‍යයන් සඳහා නියමිත තරගවලට සඳහා රජයේ / අර්ධ රාජ්‍ය / පෞද්ගලික / ජාත්‍යන්තර පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහභාගී විය හැකි අතර, පාසල් ගුරුවරුන් සඳහා නියමිත 'හොඳම පර්යේෂණ පත්‍රිකාව' තරගයට රජයේ / අර්ධ රාජ්‍ය / පෞද්ගලික / ජාත්‍යන්තර පාසල්වල ගුරුවරුන්ට සහභාගි විය හැකි ය.

එක් එක් තරග සඳහා ඒ ඒ තරගවලට අදාළ පරිදි වයස් කාණ්ඩ හා භාෂා මාධ්‍යය වශයෙන් වෙන් වෙන් ව ජයග්‍රාහකයන් (ප්‍රථම, දෙවැනි, තෙවැනි ස්ථාන සහ කුසලතා සහතික) තෝරා ගන්නා අතර එම ජයග්‍රාහකයන් සඳහා වටිනා සහතික පත්‍ර හා ත්‍යාග පිරි නැමේ.

ඇතැම් තරග සඳහා ලියාපදිංචි තැපෑලෙන් හා විද්‍යුත් තැපෑලෙන් නිර්මාණ එවිය හැකි අතර ඇතැම් තරග සඳහා නිර්මාණ එවිය හැක්කේ විද්‍යුත් තැපෑලෙන් පමණි.

සියලු ම තරග සඳහා පහත පොදු කොන්දේසි අදාළ වේ. ඊට අමතර ව එක් එක් තරග සඳහා අදාළ කොන්දේසි කෙරෙහි ද විශේෂ සැලකිල්ලෙන් යුතු ව නිර්මාණ එවිය යුතු ය. එම කොන්දේසිවලට අනුකූල නොවන නිර්මාණ පූර්ව දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කෙරේ.

<u>පොදු කොන්දේසි</u>

1. නිර්මාණ ඉදිරිපත් කරන ශිෂ්‍යයා අදාළ පාසලේ ශිෂ්‍යයෙකු වීම අනිවාර්ය වේ. (නිර්මාණය සමඟ එවන අයදුම් පත සහතික කරන දිනට අදාළ පාසලේ අධ්‍යාපනය ලැබිය යුතු ය.)

2. සියලු නිර්මාණ, ඒ ඒ තරගවලට අදාළ මතු දැක්වෙන අයදුම් පත් ආකෘතිය සමඟ පමණක් ඉදිරිපත් කළ යුතු ය. අදාළ අයදුම් පත පාසලේ විදුහල්පති සිය අත්සන හා නිලමුද්‍රාව තබා නිර්දේශ කර ඉදිරිපත් කළ යුතු ය. අදාළ අයදුම් පතෙහි සියලු තොරතුරු නිවැරදි ව හා පැහැදිලි ව සඳහන් කළ යුතු අතර ජයග්‍රාහකයන්ට අදාළ සහතික පත් මුද්‍රණය කරන්නේ අයදුම් පතෙහි සඳහන් කර ඇති තොරතුරු අනුව පමණි. අසම්පූර්ණ හා අපැහැදිලි තොරතුරු සහිත අයදුම් පත් සමඟ ඉදිරිපත් කරන නිර්මාණ පූර්ව දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කෙරේ.

3. ඒ ඒ තරගවලට අදාළ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම් පත් සමඟ හෝ අයදුම් පත් රහිතව හෝ ඉදිරිපත් කරන නිර්මාණ පූර්ව දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කෙරේ.

4. අ.පො.ස සාමාන්‍ය පෙළ /උසස් පෙළ නිම කිරීම මත හෝ වෙනත් හේතු මත හෝ පාසල් හැරගිය දරුවන්ගේ නිර්මාණ සහිත අයදුම් පත් නිර්දේශ නොකිරීමට අදාළ විදුහල්පතිවරුන් වග බලා ගත යුතු ය. එලෙස පාසල් හැරගිය දරුවන්ගේ නිර්මාණ සඳහා යම් ජයග්‍රහණයක් ලදහොත් එම ජයග්‍රහණ අවලංගු කෙරේ. යම් නිර්මාණයක් පාසල් හැරගිය දරුවෙකුගේ බව තහවුරු වුවහොත් එම නිර්මාණ පූර්ව දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කෙරේ.

5. ඒ ඒ තරග සඳහා අදාළ තරග කොන්දේසිවලට අනුකූල නොවන නිර්මාණ ද පූර්ව දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කෙරේ.

6. සිය නිර්මාණ A4 ප්‍රමාණයේ කඩදාසිවල (තනි පැත්ත පමණක්) පැහැදිලි අත්අකුරින් හෝ පරිගණකයෙන් අක්ෂර සංයෝජනය කර හෝ ඉදිරිපත් කළ යුතු ය. එසේ ම සියලු පිටු අංක කර තිබිය යුතු ය.

7. පරිගණකයෙන් අක්ෂර සංයෝජනය කර ඉදිරිපත් කරන්නේ නම් පහත පරිදි අක්ෂර සංයෝජනය කළ යුතු ය.

අකුරුවල ප්‍රමාණය	**:**	**12**
පේළි පරතරය	**:**	**1.5**
පිටු මායිම්	**:**	**උඩ - අඟල් 1, යට - අඟල් 1, වම - අඟල් 1.5, දකුණ - අඟල් 1**
අකුරු වර්ණය	**:**	**කළු**
අකුරු වර්ගය	**:**	**සිංහල - Iskoola Potha, දෙමළ - Baamini,** **ඉංග්‍රීසි - Times New Roman**

8. තරග සඳහා ඉදිරිපත් කරන නිර්මාණ, ඊට අදාළ අයදුම් පත් ඉදිරිපත් කරන ශිෂ්‍යයන්ගේ ස්වතන්ත්‍ර නිර්මාණ විය යුතු ය.

9. එක් ශිෂ්‍යයෙකුට ඕනෑ ම තරග සංඛ්‍යාවක් සඳහා නිර්මාණ ඉදිරිපත් කළ හැකි අතර ඉදිරිපත් වන සියලු තරග සඳහා වෙන වෙන ම අයදුම් පත් එවිය යුතු ය. එක් තරගයක් සඳහා එක් අයදුම්කරුවෙකුට උපරිම ලෙස නිර්මාණ 02ක් පමණක් ඉදිරිපත් කළ හැකි ය.

10. ලියාපදිංචි තැපැලෙන් හෝ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් හෝ නිර්මාණ හා අයදුම් පත් යොමු කළ හැකි ය. ලියාපදිංචි තැපැලෙන් නිර්මාණ හා අයදුම් පත් එවන්නේ නම්,

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
අංක 163, පොල්හේන්ගොඩ
කොළඹ 05.

යන ලිපිනයට එවිය යුතු ය. ලියාපදිංචි තැපැලෙන් නිර්මාණ හා අයදුම් පත් එවීමේදී ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ද විද්‍යුත් තැපැල් මාර්ගයෙන් නිර්මාණ යොමු කිරීමේ දී අදාළ විද්‍යුත් තැපැල් පණිවිඩයේ විෂය (Subject) ලෙස ද 'අදාළ තරගය කුමක් ද' යන්න පහත පරිදි නිශ්චිත ව සඳහන් කළ යුතු ය.

'ඇසිදිසි විදුමඟ පාසල් නිර්මාණ තරගාවලිය - <තරගයේ නම> - <කනිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ / විවෘත අංශය> - <සිංහල / දෙමළ / ඉංග්‍රීසි මාධ්‍ය>'

උදා: යම් ශිෂ්‍යයෙකු ජ්‍යෙෂ්ඨ අංශයේ ඉංග්‍රීසි මාධ්‍යය නිවේදන තරගය සඳහා ඉදිරිපත් වන්නේ නම්, එම ශිෂ්‍යයා තම අයදුම් පත හා වීඩියෝ පටය එවන හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයේ විෂය (Subject) ලෙස හෝ ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තරගය කුමක් ද යන්න සඳහන් කළ යුත්තේ; **'ඇසිදිසි විදුමඟ පාසල් නිර්මාණ තරගාවලිය - නිවේදන තරගය - ජ්‍යෙෂ්ඨ අංශය - ඉංග්‍රීසි මාධ්‍යය'** යන පරිදි ය.

11. ප්‍රවීණ විද්වත් විනිශ්චය මණ්ඩලයක් විසින් නිර්මාණ විනිශ්චය කරනු ලබන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ. ඉදිරිපත් වූ නිර්මාණවල ස්වතන්ත්‍රභාවය හා අයිතිය හැර විනිශ්චය මණ්ඩලයේ තීරණ නැවත සලකා බැලීම සඳහා වන කිසිදු ඉල්ලීමක් භාර නොගැනේ.

12. **නිර්මාණ භාරගන්නා අවසාන දිනය 2026 ඔක්තෝම්බර් 15** වන අතර ප්‍රමාද වී ලැබෙන නිර්මාණ පූර්ව දැනුම් දීමකින් තොර ව ප්‍රතික්ෂේප කෙරේ.

තරග ලැයිස්තුව

අනු අංකය	තරගය		වයස් කාණ්ඩය	භාෂා මාධ්‍යය	තරග අංකය
1	කෙටිකතා තරගය		කනිෂ්ඨ	සිංහල	1
				දෙමළ	2
				ඉංග්‍රීසි	3
			ජ්‍යෙෂ්ඨ	සිංහල	4
				දෙමළ	5
				ඉංග්‍රීසි	6
2	තිර පිටපත් රචනා තරගය		කනිෂ්ඨ	සිංහල	7
				දෙමළ	8
				ඉංග්‍රීසි	9
			ජ්‍යෙෂ්ඨ	සිංහල	10
				දෙමළ	11
				ඉංග්‍රීසි	12
3	ඡායාරූප තරගය		කනිෂ්ඨ	අදාළ නොවේ	13
			ජ්‍යෙෂ්ඨ	අදාළ නොවේ	14
4	නිවේදන තරගය		කනිෂ්ඨ	සිංහල	15
				දෙමළ	16
				ඉංග්‍රීසි	17
			ජ්‍යෙෂ්ඨ	සිංහල	18
				දෙමළ	19
				ඉංග්‍රීසි	20
5	කෙටි චිත්‍රපට තරගය	හොඳම නිෂ්පාදනය	කනිෂ්ඨ	අදාළ නොවේ	21
		හොඳම අධ්‍යක්ෂණය		අදාළ නොවේ	22
		හොඳම රංගනය		අදාළ නොවේ	23
		හොඳම කැමරාකරණය		අදාළ නොවේ	24
		හොඳම සංගීත හා ශබ්ද නිර්මාණය		අදාළ නොවේ	25
		හොඳම නිෂ්පාදනය	ජ්‍යෙෂ්ඨ	අදාළ නොවේ	26
		හොඳම අධ්‍යක්ෂණය		අදාළ නොවේ	27
		හොඳම රංගනය		අදාළ නොවේ	28
		හොඳම කැමරාකරණය		අදාළ නොවේ	29
		හොඳම සංගීත හා ශබ්ද නිර්මාණය		අදාළ නොවේ	30
6	විශිෂ්ටතම පාසල් මාධ්‍ය සහරාව		විවෘත	අදාළ නොවේ	31

7	විශිෂ්ටතම පාසල් මාධ්‍ය ගුවන්විදුලි සේවය	විවෘත	අදාළ නොවේ	32
8	විශිෂ්ටතම පාසල් Facebook පිටුව	විවෘත	අදාළ නොවේ	33
9	විශිෂ්ටතම පාසල් YouTube නාලිකාව	විවෘත	අදාළ නොවේ	34
10	විශිෂ්ටතම පර්යේෂණ පත්‍රිකාව	ගුරුවරුන් සඳහා	අදාළ නොවේ	35

<u>තරග කොන්දේසි</u>

1. කෙටිකතා තරගය

I. මෙම තරගය කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ වයස් කාණ්ඩවලින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පැවැත්වේ.

II. කෙටිකතාව සඳහා කැමති තේමාවක් (වස්තු විෂයක්) පාදක කර ගත හැකි අතර උපරිම වචන 2500ක් විය යුතු ය.

III. තරගය සඳහා ඉදිරිපත් කරන කෙටිකතා මීට පෙර වෙනත් කිසිදු තරගයක් සඳහා ඉදිරිපත් නොකළ කෙටිකතා විය යුතු ය.

IV. එක් තරගකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ උපරිම කෙටිකතා 02ක් පමණි.

V. ඉදිරිපත් කරන කෙටිකතාව සඳහා ඊට අදාළ තේමාවට සුදුසු පරිදි වූ හඳුනාගැනීමේ නාමයක් යෙදිය යුතු ය.

VI. තරගාවලියට අදාළ පොදු කොන්දේසි අංක 06, 07 හා 10 පිළිබඳ විශේෂ සැලකිල්ලකින් යුතු ව නිර්මාණ ඉදිරිපත් කළ යුතු ය.

VII. සාමාන්‍ය කෙටිකතාවක පවතින මූලික ආකෘතික ලක්ෂණ අනුගමනය කර තිබිය යුතු ය.

VIII. තරගයට ඉදිරිපත් කරන කෙටිකතා අදාළ තරගකරුගේ ම නිර්මාණ විය යුතු ය. තරගයේ ප්‍රතිඵල නිකුත් වීමෙන් පසුව වුව ද යම් කෙටිකතාවක් අදාළ තරගකරුගේ නිර්මාණයක් නොවන බව තහවුරු වුවහොත් ජයග්‍රහණය අවලංගු කෙරේ.

IX. නිර්මාණය සමඟ 'ආකෘතිය 01' පරිදි අයදුම් පතක් එවීම ද අනිවාර්ය වේ.

X. තරගාවලියට අදාළ අනෙකුත් පොදු කොන්දේසි සියල්ල ම එලෙස ම අදාළ වේ.

XI. විද්‍යුත් තැපැල් මාර්ගයෙන් නිර්මාණ එවන්නේ නම්, **publicationcolombo@gmail.com** යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු ය.

2. තිර පිටපත් රචනා තරගය

I. මෙම තරගය කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ වයස් කාණ්ඩවලින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පැවැත්වේ.

II. තිර රචනය සඳහා කැමති තේමාවක් (වස්තු විෂයක්) පාදක කර ගත හැකි ය.

III. විනාඩි 10 – 15 අතර කෙටි චිත්‍රපටයක් වෙනුවෙන් රචනා කළ තිර පිටපතක් විය යුතු ය. වාර්තා චිත්‍රපට සඳහා තිර පිටපත් නොව කතානුසාරී කෙටි චිත්‍රපටයක් සඳහා සුදුසු තිර රචනාවක් විය යුතු ය.

IV. මෙම තරගාවලියට ඉදිරිපත් කරන කෙටි චිත්‍රපටවල තිර පිටපත් රචනා මෙම තරගය සඳහා ඉදිරිපත් කිරීමේ කිසිදු බාධාවක් නැත.

V. කතාංගය පමණක් නොව තිර රචනාවක තිබිය යුතු මූලික අංග කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු ය. එබැවින් තිර රචනා හා කෙටි චිත්‍රපට තරග සඳහා වන මෙහි පහත සඳහන් මාර්ගෝපදේශ කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය.

VI. එක් තරගකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ උපරිම තිර පිටපත් රචනා 02ක් පමණි.

VII. තරගය සඳහා ඉදිරිපත් කරන තිර පිටපත් රචනා මීට පෙර වෙනත් කිසිදු තරගයක් සඳහා ඉදිරිපත් නොකළ තිර පිටපත් විය යුතු ය.

VIII. ඉදිරිපත් කරන තිර පිටපත් රචනා සඳහා ඊට අදාළ තේමාවට සුදුසු පරිදි වූ හඳුනාගැනීමේ නාමයක් යෙදිය යුතු ය.

IX. තරගාවලියට අදාළ පොදු කොන්දේසි අංක 06, 07 හා 10 පිළිබඳ විශේෂ සැලකිල්ලකින් යුතු ව නිර්මාණ ඉදිරිපත් කළ යුතු ය.

X. තරගයට ඉදිරිපත් කරන තිර පිටපත් රචනා අදාළ තරගකරුගේ ම නිර්මාණ විය යුතු ය. තරගයේ ප්‍රතිඵල නිකුත් වීමෙන් පසුව වුව ද යම් තිර පිටපත් රචනයක් අදාළ තරගකරුගේ නිර්මාණයක් නොවන බව තහවුරු වුවහොත් ජයග්‍රහණය අවලංගු කෙරේ.

XI. නිර්මාණය සමඟ 'ආකෘතිය 01' පරිදි අයදුම් පතක් එවීම ද අනිවාර්ය වේ.

XII. තරගාවලියට අදාළ අනෙකුත් පොදු කොන්දේසි සියල්ල එලෙස ම අදාළ වේ.

XIII. විද්‍යුත් තැපැල් මාර්ගයෙන් නිර්මාණ එවන්නේ නම්, **dgiscriptcompet@gmail.com** යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු ය.

3. ඡායාරූප තරගය

I. මෙම තරගය කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ වයස් කාණ්ඩවලින් භාෂා මාධ්‍යය නොසලකා විවෘත ව පැවැත්වේ.

II. පහත සඳහන් තේමා යටතේ ඡායාරූප ඉදිරිපත් කළ හැකි ය.
- පරිසර සුරක්ෂිතතාව සහ දේශගුණික විපර්යාස
- සාමය, සහජීවනය සහ ශ්‍රී ලාංකික අනන්‍යතාව
- ජල සම්පත සහ එහි වටිනාකම
- ක්‍රීඩා කුසලතා සහ ක්‍රියාශීලී තරුණකම
- නාගරීකරණය සහ එහි බලපෑම

III. සියලු ම ඡායාරූප අඟල් 10 x 12 ප්‍රමාණයෙන් වර්ණ හෝ කළු-සුදු වර්ණවලින් හෝ මුද්‍රණය කර ඉදිරිපත් කළ යුතු ය. නොඑසේ නම් එම ප්‍රමාණයෙන් වර්ණ හෝ කළු-සුදු වර්ණවලින් හෝ යුතු ව විද්‍යුත් තැපෑලෙන් එවිය යුතු ය.

IV. තරගයට ඉදිරිපත් කරන ඡායාරූප අදාළ තරගකරු විසින් ම ලබා ගන්නා ලද ඡායාරූප විය යුතු ය. තරගයේ ප්‍රතිඵල නිකුත් වීමෙන් පසුව වුව ද යම් ඡායාරූපයක් අදාළ තරගකරු ලබා ගත් ඡායාරූපයක් නොවන බව තහවුරු වුවහොත් ජයග්‍රහණය අවලංගු කෙරේ.

V. තරගයට ඉදිරිපත් කරන ඡායාරූප මීට පෙර වෙනත් කිසිදු තරගයක් සඳහා ඉදිරිපත් නොකළ ඡායාරූප විය යුතු ය.

VI. එක් තරගකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ උපරිම ඡායාරූප 02ක් පමණි.

VII. ඉදිරිපත් කරන ඡායාරූප සඳහා ඊට අදාළ තේමාවට සුදුසු පරිදි වූ හඳුනා ගැනීමේ නාමයක් යෙදිය යුතු ය.

VIII. වෘත්තීය කැමරා මෙන් ම ස්මාර්ට් ජංගම දුරකථන (Smartphones) මගින් ලබා ගත් ඡායාරූප ද තරගය සඳහා ඉදිරිපත් කළ හැකි ය.

IX. ලියාපදිංචි තැපෑලෙන් ඡායාරූප එවන්නේ නම් අදාළ ඡායාරූපය පිටුපස ද විද්‍යුත් තැපෑලෙන් ඡායාරූප එවන්නේ නම් ඡායාරූපය අමුණා එවන විද්‍යුත් තැපැල් පණිවිඩයේ ද පහත තොරතුරු පැහැදිලි ව සඳහන් කර තිබිය යුතු ය. (තරගකරුගේ සම්පූර්ණ නම, පාසලේ නම සහ ලිපිනය, තරග කරන කාණ්ඩය: කනිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ, ඡායාරූපයේ තේමාව, ඡායාරූපය හැඳින්වීම සඳහා වන නම සහ තරගකරු සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකයක්)

X. නිර්මාණය සමඟ 'ආකෘතිය 01' පරිදි අයදුම් පතක් එවීම ද අනිවාර්ය වේ.

XI. තරගාවලියට අදාළ අනෙකුත් පොදු කොන්දේසි සියල්ල එලෙස ම අදාළ වේ.

XII. විද්‍යුත් තැපැල් මාර්ගයෙන් නිර්මාණ එවන්නේ නම් **govphotonews.ex@gmail.com** යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු ය.

4. නිවේදන තරගය

I. මෙම තරගය කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ වයස් කාණ්ඩවලින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පැවැත්වේ.

II. තරගකරුවන් තම ඉදිරිපත් කිරීම වීඩියෝගත කර විද්‍යුත් තැපැල් මාර්ගයෙන් එවිය යුතු ය.

III. වීඩියෝවේ උපරිම කාලය විනාඩි 6ක් විය යුතු ය. වීඩියෝවක උපරිම විනාඩි 03ක් පමණ වන ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමක් හා උපරිම විනාඩි 03ක් පමණ වන වාර්තාමය හෝ විශේෂාංගමය හෝ වැඩසටහන් ඉදිරිපත් කිරීමක් ඇතුළත් විය යුතු ය.

IV. වීඩියෝවේ දර්ශන හා හඬ ඉතා පැහැදිලි විය යුතු අතර, වීඩියෝව ආරම්භයේදී තරගකරුගේ නම, ඉදිරිපත් වන වයස් කාණ්ඩය හා පාසලේ නම පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

V. වීඩියෝවට ඇතුළත් ඉදිරිපත් කිරීම් 02ම එකවර පටිගත කොට තිබිය යුතු අතර කිසිදු හේතුවක් මත අතරමැදදී සංස්කරණය නොකළ යුතු ය.

VI. වීඩියෝවේ ඇතුළත් ඉදිරිපත් කිරීම් 02 අදාළ තරගකරු ඉදිරිපත් කළ යුතු අතර වෙනත් ආකාරවලින් හඬකැවීම් සිදු නොකළ යුතු ය.

VII. වීඩියෝ එවිය යුත්තේ MP4 හෝ MOV හෝ ලෙස ය.

VIII. ඉදිරිපත් කිරීම්වලදී වචන උච්චාරණය, හඬ පාලනය, භාෂා භාවිතය, ඉදිරිපත් කිරීමේ ශෛලිය, ඉදිරිපත් කිරීමේ විශ්වසනීයභාවය, නිර්මාණශීලීත්වය, කාල කළමනාකරණය, ප්‍රේක්ෂක ආකර්ෂණය පවත්වා ගැනීම හා අන්තර්ගතයේ සංවිධානාත්මකභාවය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු ය.

IX. එක් තරගකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් වීඩියෝවක් පමණි.

X. වීඩියෝව සමඟ 'ආකෘතිය 01' පරිදි අයදුම් පතක් එවීම ද අනිවාර්ය වේ.

XI. අවසන් වටයට තෝරා ගන්නා තරගකරුවන්, ඉදිරියේදී දැනුම් දෙන ස්ථානයකට කැඳවා සජීව තරගයක් පැවැත්වේ.

XII. තරගාවලියට අදාළ අනෙකුත් පොදු කොන්දේසි සියල්ල එලෙස ම අදාළ වේ.

XIII. වීඩියෝ එවිය යුත්තේ **dgi.announcing@gmail.com** යන විද්‍යුත් තැපෑලට පමණි.

5. කෙටි චිත්‍රපට තරගය

I. මෙම තරගය කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ වයස් කාණ්ඩවලින් භාෂා මාධ්‍යය නොසලකා විවෘත ව පැවැත්වේ.

II. වෘත්තීය කැමරා මෙන් ම ස්මාර්ට් ජංගම දුරකථන (Smartphones) මගින් පටිගත කළ කෙටි චිත්‍රපට ද තරගය සඳහා ඉදිරිපත් කළ හැකි ය.

III. පාසල් ප්‍රජාවට සුදුසු ඕනෑ ම තේමාවක් යටතේ කෙටි චිත්‍රපට නිර්මාණය කළ හැකි ය.

IV. ඉදිරිපත් කරන කෙටි චිත්‍රපටය සඳහා ඊට අදාළ තේමාවට සුදුසු පරිදි වූ හඳුනා ගැනීමේ නාමයක් යෙදිය යුතු ය.

V. මෙය පාසල් මට්ටමේ තරගයක් බැවින් එක් පාසලකින් එක් වයස් කාණ්ඩයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ කෙටි චිත්‍රපට 02ක් පමණි.

VI. තරගය සඳහා ඉදිරිපත් කරන කෙටි චිත්‍රපට මීට පෙර වෙනත් කිසිදු තරගයක් සඳහා ඉදිරිපත් නොකළ ඒවා විය යුතු ය.

VII. විනාඩි 10 – 15 අතර කෙටි චිත්‍රපටයක් විය යුතු ය.

VIII. කතාංගය පමණක් නොව කෙටි චිත්‍රපටයක තිබිය යුතු මූලික අංග කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු ය. එබැවින් තිර රචනා හා කෙටි චිත්‍රපට තරග සඳහා වන මෙහි පහත සඳහන් මාර්ගෝපදේශ කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය.

IX. තාක්ෂණික කටයුතු සඳහා ගුරුවරුන්ගේ සහයෝගය හා උපදේශනය ලබා ගත හැකි වුවත් කෙටි චිත්‍රපටයේ සම්පූර්ණ නිෂ්පාදනයට අදාළ සියල්ල පාසල් ශිෂ්‍යයන් විසින් ම සිදු කරනු ලැබිය යුතු ය.

X. තරගයට ඉදිරිපත් කරන කෙටි චිත්‍රපට අදාළ තරගකරුවන් විසින් ම නිර්මාණය කරනු ලැබිය යුතු ය. තරගයේ ප්‍රතිඵල නිකුත් වීමෙන් පසුව වුව ද කෙටි චිත්‍රපටය තරගකරුවන් විසින් නිර්මාණය කළ කෙටි චිත්‍රපටයක් නොවන බව තහවුරු වුවහොත් ජයග්‍රහණය අවලංගු කෙරේ.

XI. කෙටි චිත්‍රපට එවිය යුත්තේ MP4 හෝ MOV ලෙස ය.

XII. ඉදිරිපත් කරන කෙටි චිත්‍රපට සියල්ල ම හොඳම නිෂ්පාදනය, හොඳම අධ්‍යක්ෂණය, හොඳම රංගනය, හොඳම කැමරාකරණය, හොඳම ශබ්ද හා සංගීත නිර්මාණය යන සම්මාන සඳහා ද සලකා බැලේ.

XIII. නිර්මාණය සමඟ ‘ආකෘතිය 02’ පරිදි අයදුම් පතක් එවීම ද අනිවාර්ය වේ.

XIV. තරගාවලියට අදාළ අනෙකුත් පොදු කොන්දේසි සියල්ල එලෙස ම අදාළ වේ.

XV. විද්‍යුත් තැපැල් මාර්ගයෙන් නිර්මාණ එවන්නේ නම්, editgfu@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු ය.

6. විශිෂ්ටතම පාසල් මාධ්‍ය සඟරාව

I. මෙම තරගය වයස් කාණ්ඩ හෝ භාෂා මාධ්‍යය හෝ නොසලකා විවෘත ව පැවැත්වේ.

II. සඟරාව A4 ප්‍රමාණයේ පිටුවලින් සකස් විය යුතු ය.

III. සඟරාවේ පිටකවරය වර්ණ විය යුතු අතර ඇතුළත පිටු වර්ණ හෝ කළු සුදු හෝ මිශ්‍ර හෝ විය හැකි ය.

IV. පිටු ගණන 20 - 30 අතර විය යුතු ය.

V. සඟරාවට සුදුසු පරිදි විවිධ ප්‍රමාණයේ අකුරු වර්ගවලින් භාවිත කළ හැකි ය.

VI. සඟරාව මුද්‍රිත හෝ විද්‍යුත් සඟරාවක් (E-Magazine) හෝ ලෙස නිර්මාණය කළ හැකි ය.

VII. ඉදිරිපත් කරන සඟරාව සඳහා ඊට අදාළ තේමාවට සුදුසු පරිදි වූ හඳුනා ගැනීමේ නාමයක් යෙදිය යුතු ය.

VIII. සඟරාවට ඇතුළත් කරන ලිපි පාසල් ශිෂ්‍යයන්ගේ නිර්මාණ හෝ ලිපි හෝ විය යුතු ය.

IX. පාසල් ප්‍රජාවගේ පරිශීලනයට යෝග්‍ය ලෙස ආර්ථික, දේශපාලන, කලා, සාහිත්‍ය, විද්‍යා, ක්‍රීඩා, විදෙස් තොරතුරු ආදී ඕනෑ ම විෂය පථයක ලිපි හා ඡායාරූප, චිත්‍ර, කාටුන්, රූප සටහන්, ප්‍රහේලිකා, ප්‍රස්ථාර ආදිය සඟරාවට ඇතුළත් කළ හැකි ය.

X. සඟරාවේ කිසිදු පළ කිරීමක් වෙනත් නිර්මාණයක ප්‍රකාශන හිමිකම් උල්ලංඝනය කිරීමක් හෝ සොරකම් කිරීමක් හෝ නොවිය යුතු ය.

XI. සඟරාවේ පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල ඇති කරුණු නිවැරදි විය යුතු ය.

XII. සඟරාවේ පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල වෛරී ප්‍රකාශ ඇතුළත් නොවිය යුතු අතර අපහාසාත්මක / අශෝභන භාෂා භාවිතයෙන් වැළකිය යුතු ය.

XIII. සඟරාවේ පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල ජාතිය, ජනවාර්ගිකත්වය, ආගම, ස්ත්‍රීපුරුෂභාවය, ආබාධිතභාවය හෝ වෙනත් ලක්ෂණ හෝ මත පදනම් වූ වෙනස්කොට සැලකීම් සහිත කිසිවත් ඇතුළත් නොවිය යුතු ය. සංස්කෘතික හා ආගමික විවිධත්වයට ගරු කළ යුතු ය.

XIV. සඟරාවේ පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල පැහැදිලි ප්‍රචණ්ඩත්වය හා පාසල් ප්‍රජාවට යෝග්‍ය නොවන කිසිවක් නොතිබිය යුතු ය.

XV. සංස්කෘතිකමය වශයෙන් සංවේදී සහ සියලු දෙනා ඇතුළත් කර ගන්නාසුලු (Inclusive) විය යුතු ය.

XVI. කථන හෝ ලිඛිත හෝ මිශ්‍ර ශෛලිය හෝ සඟරාවේ වාග්වින්‍යාසය සඳහා භාවිත කළ හැකි අතර ලිපිවල අක්ෂර වින්‍යාසය, වියරණ දෝෂ, පද බෙදීම ආදිය පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

XVII. සාමාන්‍ය සඟරාවක පවතින මූලික ආකෘතික ලක්ෂණ අනුගමනය කර තිබිය යුතු ය.

XVIII. එක ම සඟරාවක භාෂා කිහිපයක් භාවිත කරමින් ලිපි හා නිර්මාණ ඇතුළත් නොකළ යුතු ය.

XIX. මෙය පාසල් මට්ටමේ තරගයක් බැවින් එක් පාසලකින් එක් වයස් කාණ්ඩයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ සහරා 02ක් පමණි.

XX. නිර්මාණය සමඟ 'ආකෘතිය 02' පරිදි අයදුම් පතක් එවීම ද අනිවාර්ය වේ.

XXI. තරගාවලියට අදාළ අනෙකුත් පොදු කොන්දේසි සියල්ල එලෙස ම අදාළ වේ.

XXII. විද්‍යුත් තැපැල් මාර්ගයෙන් නිර්මාණ එවන්නේ නම්, desathiya.editor@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු ය.

7. විශිෂ්ටතම පාසල් මාධ්‍ය ගුවන්විදුලි සේවය

I. මෙම තරගය වයස් කාණ්ඩ හෝ භාෂා මාධ්‍යය නොසලකා විවෘත ව පැවැත්වේ.

II. තරගය සඳහා ඉදිරිපත් කරන ගුවන්විදුලි සේවය භාෂා මාධ්‍ය එකකින් හෝ කිහිපයකින් හෝ ක්‍රියාත්මක වීම තරගයට ඉදිරිපත් වීම සඳහා බාධාවක් නොවේ.

III. තරගය සඳහා ඉදිරිපත් කරන ගුවන්විදුලි සේවය යම් පාසලක් විසින් පවත්වාගෙන යනු ලබන ගුවන්විදුලි සේවයක් විය යුතු ය.

IV. අයදුම් පත් කැඳවන දිනට අවම මාස 06කට පෙර සිට තරගය සඳහා ඉදිරිපත් කරන ගුවන්විදුලි සේවයක් ලෙස අඛණ්ඩ ව ක්‍රියාත්මක වී තිබිය යුතු ය.

V. තරගය සඳහා ඉදිරිපත් කරන ගුවන්විදුලි සේවයේ වැඩසටහන් ඉදිරිපත් කරන සියලු දෙනා අදාළ පාසලේ ශිෂ්‍යයන් වීම අනිවාර්ය වේ.

VI. තාක්ෂණික කටයුතු සඳහා ගුරුවරුන්ගේ හා වෙනත් බාහිර පාර්ශ්වයන්ගේ සහයෝගය හා උපදේශනය ලබා ගත හැකි වුවත් වැඩසටහන් මෙහෙයවීම හා එම වැඩසටහන්වලට අන්තර්ගත නිර්මාණය කිරීම, තිර පිටපත් ලිවීම යන සියල්ල පාසල් ශිෂ්‍යයන් විසින් ම සිදු කරනු ලැබිය යුතු ය.

VII. සාමාන්‍ය ගුවන්විදුලි සේවයක පවතින මූලික ආකෘතික ලක්ෂණ අනුගමනය කර තිබිය යුතු ය.

VIII. පාසල් ප්‍රජාවගේ පරිශීලනයට යෝග්‍ය ලෙස ආර්ථික, දේශපාලන, කලා, සාහිත්‍ය, විද්‍යා, ක්‍රීඩා, විදෙස් තොරතුරු ආදී ඕනෑ ම විෂය පථයක කරුණු ඇතුළත් වැඩසටහන් තරගය සඳහා ඉදිරිපත් කරන ගුවන්විදුලි සේවයෙන් විකාශය කළ හැකි ය.

IX. තරගය සඳහා ඉදිරිපත් කරන ගුවන්විදුලි සේවය මඟින් විකාශය කරන අන්තර්ගතවල / නිර්මාණවල ඇති කරුණු නිවැරදි විය යුතු ය.

X. තරගය සඳහා ඉදිරිපත් කරන ගුවන්විදුලි සේවය මඟින් විකාශය කරන අන්තර්ගතවල / නිර්මාණවල පාසල් ප්‍රජාවට අදාළ කරුණු ඇතුළත් විය යුතු ය.

XI. තරගය සඳහා ඉදිරිපත් කරන ගුවන්විදුලි සේවය මඟින් විකාශය කරන අන්තර්ගතවල / නිර්මාණවල හඬ, ශබ්ද, සංගීත ආදිය පැහැදිලි තත්ත්වයෙන් පටිගත කර ඕඩියෝපට ලෙස එවිය යුතු ය. සම්පූර්ණයෙන් අඛණ්ඩ සතියක කාලයට අදාළ විවිධ වර්ගයේ වැඩසටහන් ආවරණය වන පරිදි උපරිම වැඩසටහන් දහයක් (10) පමණක් එහි අන්තර්ගත විය යුතු ය. එම වැඩසහටන්වලට අදාළ නිෂ්පාදන කණ්ඩායම්වල තොරතුරු ද, වැඩසටහන් අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතු ය.

XII. තරගය සඳහා ඉදිරිපත් කරන ගුවන්විදුලි සේවය මඟින් විකාශය කරන අන්තර්ගතවල / නිර්මාණවල වෛරී ප්‍රකාශ හෝ අපහාසාත්මක/අශෝභන භාෂා භාවිතය නොතිබිය යුතු ය.

XIII. තරගය සඳහා ඉදිරිපත් කරන ගුවන්විදුලි සේවය මඟින් විකාශය කරන අන්තර්ගතවල / නිර්මාණවල ජාතිය, ජනවාර්ගිකත්වය, ආගම, ස්ත්‍රී/පුරුෂභාවය, ආබාධිතභාවය හෝ වෙනත් ලක්ෂණ මත හෝ පදනම් වූ වෙනස් කොට සැලකීම් සහිත කිසිවත් ඇතුළත් නොවිය යුතු ය. සංස්කෘතික හා ආගමික විවිධත්වයට ගරු කළ යුතු ය.

XIV. තරගය සඳහා ඉදිරිපත් කරන ගුවන්විදුලි සේවය මඟින් විකාශය කරන අන්තර්ගතවල / නිර්මාණවල පැහැදිලි ප්‍රචණ්ඩත්වය හා පාසල් ප්‍රජාවට යෝග්‍ය නොවන කිසිවක් නොතිබිය

යුතු ය. සංස්කෘතිකමය වශයෙන් සංවේදී සහ සියලු දෙනා ඇතුළත් කර ගන්නාසුලු (Inclusive) විය යුතු ය.

XV. යම් පාසලක් ගුවන්විදුලි සේවා එකකට වඩා වැඩි ප්‍රමාණයක් මෙම තරගය සඳහා ඉදිරිපත් කරන්නේ නම්, එලෙස තරගය සඳහා ඉදිරිපත් කරන එම එක් එක් ගුවන්විදුලි සේවා සඳහා වෙන වෙනම අයදුම් පත් ඉදිරිපත් කළ යුතු ය.

XVI. මෙම තරගය සඳහා ඉදිරිපත් වන පාසල් 'ආකෘතිය 02' පරිදි සකස් කළ අයදුම් පතක් **schoolradio26@gmail.com** යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු ය. (මෙම තරගය සඳහා අයදුම් පත් එවිය හැක්කේ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් පමණි.)

XVII. තරගාවලියට අදාළ අනෙකුත් පොදු කොන්දේසි සියල්ල එලෙස ම අදාළ වේ.

8. විශිෂ්ටතම පාසල් Facebook පිටුව

I. මෙම තරගය වයස් කාණ්ඩ හෝ භාෂා මාධ්‍යය නොසලකා විවෘත ව පැවැත්වේ.

II. තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුව භාෂා මාධ්‍යය එකකින් හෝ කිහිපයකින් ක්‍රියාත්මක වීම තරගයට ඉදිරිපත් වීම සඳහා බාධාවක් නොවේ.

III. අයදුම් පත් කැඳවන දිනට අවම මාස 06කට පෙර සිට තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුව, Facebook පිටුවක් ලෙස අඛණ්ඩව නිතිපතා යාවත්කාලීන වී තිබිය යුතු ය.

IV. තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුව පාසල් විදුහල්පතිගේ අනුදැනුම හා ගුරුවරුන්ගේ මහ පෙන්වීම මත ක්‍රියාත්මක අදාළ පාසලේ නිල Facebook පිටුව හෝ එම පාසලේ ක්‍රීඩා කණ්ඩායමක, ශිෂ්‍ය සංගමයක / සමිතියක නිල Facebook පිටුවක් හෝ විය යුතු ය. (ආදි ශිෂ්‍ය සංගම්, පාසල් සංවර්ධන සමිති ආදිය නොවේ.)

V. තාක්ෂණික කටයුතු සඳහා ගුරුවරුන්ගේ, ආදිශිෂ්‍යයන්ගේ හා වෙනත් බාහිර පාර්ශ්වවල සහයෝගය හා උපදේශනය ලබා ගත හැකි වුවත්, තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුවේ අදාළ අන්තර්ගතයන් නිර්මාණය කිරීම සියල්ල පාසල් ශිෂ්‍යයන් විසින් ම සිදු කරනු ලැබිය යුතු ය.

VI. වෙනත් Facebook පිටුවල අන්තර්ගත සෘජුව ම පළ කිරීම වෙනුවට, තම අන්තර්ගත නිර්මාණ තමන් විසින් ම නිර්මාණය කර පළ කොට තිබිය යුතු ය.

VII. තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුවේ පළ කිරීම්වලින් වෙනත් නිර්මාණයක ප්‍රකාශන හිමිකම් උල්ලංඝනය කිරීමක් හෝ සොරකම් කිරීමක් හෝ නොවිය යුතු ය.

VIII. පාසල් ප්‍රජාවගේ පරිශීලනයට යෝග්‍ය ලෙස ආර්ථික, දේශපාලන, කලා, සාහිත්‍ය, විද්‍යා, ක්‍රීඩා, විදෙස් තොරතුරු ආදී ඕනෑම විෂය පථයක ලිපි හා ඡායාරූප, චිත්‍ර, කාටුන්, රූප සටහන්, ප්‍රහේලිකා හා ප්‍රස්ථාර ආදිය තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුවට ඇතුළත් කළ හැකි ය.

IX. තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුවේ අරමුණට අදාළ අන්තර්ගත පමණක් ඇතුළත් කර තිබීම වඩාත් සුදුසු ය.

X. තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුව මඟින් පළ කරන අන්තර්ගතවල/ නිර්මාණවල ඇති කරුණු නිවැරදි විය යුතු ය.

XI. තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුව මඟින් පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල පාසල් ප්‍රජාවට අදාළ කරුණු ඇතුළත් විය යුතු ය.

XII. තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුව මඟින් පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල දර්ශන, ඡායාරූප, ශබ්ද ආදිය පැහැදිලි තත්ත්වයේ තිබිය යුතු ය.

XIII. තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුව මඟින් පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල වෛරී ප්‍රකාශ හෝ අපහාසාත්මක/අශෝභන භාෂා භාවිත හෝ නොතිබිය යුතු ය.

XIV. තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුව මඟින් පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල ජාතිය, ජනවාර්ගිකත්වය, ආගම, ස්ත්‍රී/පුරුෂභාවය, ආබාධිතභාවය හෝ වෙනත් ලක්ෂණ හෝ මත පදනම් වූ වෙනස් කොට සැලකීම් සහිත කිසිවත් ඇතුළත් නොවිය යුතු ය. සංස්කෘතික හා ආගමික විවිධත්වයට ගරු කළ යුතු ය.

XV. තරගය සඳහා ඉදිරිපත් කරන Facebook පිටුව මඟින් පළ කරන අන්තර්ගතවල/ නිර්මාණවල පැහැදිලි ප්‍රචණ්ඩත්වය හා පාසල් ප්‍රජාවට යෝග්‍ය නොවන කිසිවක් නොතිබිය යුතු ය. සංස්කෘතිකමය වශයෙන් සංවේදී සහ සියලු දෙනා ඇතුළත් කරගන්නාසුලු (Inclusive) විය යුතු ය.

XVI. Facebook පිටුවේ පරිශීලකයන්ට තම අදහස් පළ කිරීමේ හැකියාව තිබිය යුතු අතර පරිශීලකයන්ගේ අදහස්වලට ආචාරශීලී හා ගෞරවනීය ලෙස ප්‍රතිචාර දක්වා තිබීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරේ.

XVII. යම් පාසලක් Facebook පිටු එකකට වඩා වැඩි ප්‍රමාණයක් මෙම තරගය සඳහා ඉදිරිපත් කරන්නේ නම්, එලෙස තරගය සඳහා ඉදිරිපත් කරන එම එක් එක් Facebook පිටු සඳහා වෙන වෙනම අයදුම් පත් ඉදිරිපත් කළ යුතු ය.

XVIII. මෙම තරගය සඳහා ඉදිරිපත් වන පාසල් 'ආකෘතිය 02' පරිදි සකස් කළ අයදුම් පතක් **srilankaonlineav@gmail.com** යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු ය. (මෙම තරගය සඳහා අයදුම් පත් එවිය හැක්කේ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් පමණි.)

XIX. තරගාවලියට අදාළ අනෙකුත් පොදු කොන්දේසි සියල්ල එලෙස ම අදාළ වේ.

9. විශිෂ්ටතම පාසල් **Youtube** නාලිකාව

I. මෙම තරගය වයස් කාණ්ඩ හෝ භාෂා මාධ්‍යය හෝ නොසලකා විවෘත ව පැවැත්වේ.

II. මෙම Youtube නාලිකාව භාෂා මාධ්‍යය එකකින් හෝ කිහිපයකින් හෝ ක්‍රියාත්මක වීම තරගයට ඉදිරිපත් වීම සඳහා බාධාවක් නොවේ.

III. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාව, අයදුම් පත් කැඳවන දිනට අවම මාස 06කට ට පෙර සිට Youtube නාලිකාව ලෙස අඛණ්ඩ ව නිතිපතා යාවත්කාලීන වී තිබිය යුතු ය.

IV. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාව, පාසල් විදුහල්පතිගේ අනුදැනුම හා ගුරුවරුන්ගේ මඟ පෙන්වීම මත ක්‍රියාත්මක අදාළ පාසලේ නිල Youtube නාලිකාව හෝ එම පාසලේ ක්‍රීඩා කණ්ඩායමක, ශිෂ්‍ය සංගමයක/ සමිතියක නිල Youtube නාලිකාවක් හෝ විය යුතු ය. (ආදි ශිෂ්‍ය සංගම්, පාසල් සංවර්ධන සමිති ආදිය නොවේ.)

V. තාක්ෂණික කටයුතු සඳහා ගුරුවරුන්ගේ, ආදිශිෂ්‍යයන්ගේ හා වෙනත් බාහිර පාර්ශ්වවල සහයෝගය හා උපදේශනය ලබා ගත හැකි වුවත් තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාව මඟින් පළ කරන ලද අන්තර්ගත නිර්මාණය කිරීම් සියල්ල පාසල් ශිෂ්‍යයන් විසින්ම සිදු කරනු ලැබිය යුතු ය.

VI. වෙනත් Youtube නාලිකාවල අන්තර්ගත සෘජුව ම පළ නොකර, තම අන්තර්ගත නිර්මාණ තමන් විසින්ම නිර්මාණය කරනු ලැබ පළ කොට තිබිය යුතු ය.

VII. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාවේ කිසිදු පළ කිරීමක් වෙනත් නිර්මාණයක ප්‍රකාශන හිමිකම් උල්ලංඝනය කිරීමක් හෝ සොරකම් කිරීමක් හෝ නොවිය යුතු ය.

VIII. පාසල් ප්‍රජාවගේ පරිශීලනයට යෝග්‍ය ලෙස ආර්ථික, දේශපාලන, කලා, සාහිත්‍ය, විද්‍යා, ක්‍රීඩා, විදෙස් තොරතුරු ආදී ඕනෑ ම විෂය පථයක වීඩියෝ තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාවේ ඇතුළත් කළ හැකි ය.

IX. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාවේ අරමුණට අදාළ අන්තර්ගත පමණක් ඇතුළත් කර තිබීම වඩාත් සුදුසු ය.

X. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාව මඟින් පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල ඇති කරුණු නිවැරදි විය යුතු ය.

XI. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාව මඟින් පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල පාසල් ප්‍රජාවට අදාළ කරුණු විය යුතු ය.

XII. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාව මඟින් පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල දර්ශන, ශබ්ද ආදිය පැහැදිලි තත්ත්වයේ තිබිය යුතු ය.

XIII. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාව මඟින් පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල වෛරී ප්‍රකාශ හෝ අපහාසාත්මක / අශෝභන භාෂා භාවිත ඇතුළත් නොවිය යුතු ය.

XIV. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාව මඟින් පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල ජාතිය, ජනවාර්ගිකත්වය, ආගම, ස්ත්‍රී/පුරුෂභාවය, ආබාධිතභාවය හෝ වෙනත්

ලක්ෂණ හෝ මත පදනම් වූ වෙනස්කොට සැලකීම් සහිත කිසිවත් ඇතුළත් නොවිය යුතු ය. සංස්කෘතික හා ආගමික විවිධත්වයට ගරු කළ යුතු ය.

XV. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාව මඟින් පළ කරන අන්තර්ගතවල / නිර්මාණවල පැහැදිලි ප්‍රචණ්ඩත්වය හා පාසල් ප්‍රජාවට යෝග්‍ය නොවන කිසිවක් නොතිබිය යුතු ය. සංස්කෘතිකමය වශයෙන් සංවේදී සහ සියලු දෙනා ඇතුළත් කරගන්නාසුලු (Inclusive) විය යුතු ය.

XVI. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාවේ දායකයන්ට / නරඹන්නන්ට තම අදහස් පළ කිරීමේ හැකියාව තිබිය යුතු අතර ම ඔවුන්ගේ අදහස්වලට ආචාරශීලී හා ගෞරවනීය ලෙස ප්‍රතිචාර දක්වා තිබීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරේ.

XVII. යම් පාසලක් YouTube නාලිකා එකකට වඩා වැඩි ප්‍රමාණයක් මෙම තරගය සඳහා ඉදිරිපත් කරන්නේ නම්, එලෙස තරගය සඳහා ඉදිරිපත් කරන එම එක් එක් YouTube නාලිකා සඳහා වෙන වෙනම අයදුම් පත් ඉදිරිපත් කළ යුතු ය.

XVIII. තරගය සඳහා ඉදිරිපත් කරන Youtube නාලිකාව, 'ආකෘතිය 02' පරිදි සකස් කළ අයදුම්පතක් dgivideolk@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපියනට එවිය යුතු ය. (මෙම තරගය සඳහා අයදුම් පත් එවිය හැක්කේ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් පමණි.)

XIX. තරගාවලියට අදාළ අනෙකුත් පොදු කොන්දේසි සියල්ල එලෙස ම අදාළ වේ.

10. විශිෂ්ටතම පර්යේෂණ පත්‍රිකාව

I. මෙම තරගය රජයේ, අර්ධ රාජ්‍ය, පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසල් ගුරුවරුන් සඳහා පමණක් භාෂා මාධ්‍යය නොසලකා විවෘත ව පැවැත්වේ.

II. සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන ඕනෑම භාෂා මාධ්‍යයකින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ හැකි ය.

III. 'මාධ්‍ය ප්‍රතිපත්ති, නූතන මාධ්‍ය අභියෝග හා ඩිජිටල්කරණයේ බලපෑම' යන තේමාව යටතේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ යුතු ය.

IV. වචන 2500ට නොඅඩු සහ 3000ට නොවැඩි විය යුතු ය.

V. පරිශීලිත ග්‍රන්ථ සඳහන් කිරීමේදී හාර්වඩ් ශෛලිය (Harvard Style) අනුගමනය කළ යුතු ය.

VI. පර්යේෂකයාගේ නම, තනතුර, පාසල, විද්‍යුත් තැපැල් ලිපිනය හා දුරකථන අංකය මාතෘකාවට යටින් 10 අකුරු ප්‍රමාණයෙන් සඳහන් කළ යුතු ය.

VII. සියලු පර්යේෂණ පත්‍රිකා පරිගණකගත අක්ෂර සංයෝජනයෙන්, තරගාවලියට අදාළ පොදු කොන්දේසි අංක 06 හා 07හි සඳහන් කරුණුවලට අනුකූල වන පරිදි ඉදිරිපත් කළ යුතු ය.

VIII. තරගය සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ පත්‍රිකාව මීට පෙර වෙනත් කිසිදු තරගයක් සඳහා ඉදිරිපත් නොකළ පර්යේෂණ පත්‍රිකාවක් විය යුතු ය.

IX. එක් තරගකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ උපරිම පර්යේෂණ පත්‍රිකා 02ක් පමණි.

X. ඉදිරිපත් කරන පර්යේෂණ පත්‍රිකාව සඳහා ඊට අදාළ තේමාවට සුදුසු පරිදි වූ හඳුනා ගැනීමේ නාමයක් යෙදිය යුතු ය.

XI. සාමාන්‍ය පර්යේෂණ පත්‍රිකාවක පවතින මූලික ආකෘතික ලක්ෂණ අනුගමනය කර තිබිය යුතු ය.

XII. තරගයට ඉදිරිපත් කරන පර්යේෂණ පත්‍රිකාව අදාළ තරගකරුගේ ම රචනයක් විය යුතු ය. තරගයේ ප්‍රතිඵල නිකුත් වීමෙන් පසුව වුව ද යම් පර්යේෂණ පත්‍රිකාවක් අදාළ තරගකරුගේ රචනයක් නොවන බව තහවුරු වුවහොත් ජයග්‍රහණය අවලංගු කෙරේ.

XIII. මෙම තරගය සඳහා ඉදිරිපත් වන ගුරුවරුන් තම පර්යේෂණ පත්‍රිකාව 'ආකෘතිය 03' පරිදි සකස් කළ අයදුම් පතක් සමඟ **asidisividumaga.research@gmail.com** යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු ය. (මෙම තරගය සඳහා අයදුම් පත් එවිය හැක්කේ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් පමණි.)

XIV. තරගාවලියට අදාළ අනෙකුත් පොදු කොන්දේසි සියල්ල එලෙස ම අදාළ වේ.